# NEWS LETTER

## DHARMASHOKA BUDDHIST VIHARAYA, LEICESTER

05th March 2023

## මැදින් පුර පසළොස්වක පොහොය දිනයයි

මැදින් මහේ සඳ මෝරාගෙන එත්ම සැදැහැතියන්ගේ සිත්සතන් බුදු බැතියෙන් ඔදගැන්වෙන සිදුවීමක් නිරායාසයෙන් ම සිහියට නැගෙයි. එනම් බුදුරදුන් විසිදහසක් පමණ වූ භික්ෂු මහා සංඝයා වහන්සේ පිරිවරා ස්වකීය ජන්ම භූමිය වූ කිඹුල්වත්පුර නුවරට වැඩම කරවීම සඳහා ගමනාරම්භ කිරීමයි. වෙසක් පොහෝ දිනයෙහි කිඹුල්වත්පුරයට සැපත්වීමේ අරමුණ ඇතිව මැදින් පොහෝදා ආරම්භ කළ මෙම ගමන නිසා සිදු වූ අනුස්මරණීය සිදුවීම් ගණනාවක් ම තිබේ. ඒවා අතර ඥතීන්ගේ මානය බිඳහෙළීම, යමාමහ පෙළහර පැවැත්වීම, යශෝධරා දේවියට චන්දකින්නර ජාතකය දේශනා කිරීම, රාහුල කුමරු හා නන්ද කුමරු පැවිදි කරවීමට අවශ්‍ය පියවර ගැනීම, කාන්තාවන් පළමු වරට බුදු සසුනේ පැවිදි වීමට අවසර ඉල්ලීම හා සුද්ධෝදන මහරජු මාර්ගඵල ලැබීම යනාදිය ප්‍රමුඛත්වය ගනියි.



මේ අනුව බුදුරදුන් ස්වකීය ඥති වර්ගයා වෙනුවෙන් ධර්ම දායාදය පිරිනැමීමේ අරමුණින් යුක්තව ඓතිහාසික ගමනක් ඇරඹූ මංගල දිනයක් ලෙස මැදින් පොහෝ දිනය නම් කළ හැකි ය. ඥති වර්ගයාට පමණක් නොව රජගහනුවර සිට කිඹුල්වත්පුර නුවර දක්වා වූ සැට යොදුනක් මග දෙපසට අයත් ගම්දනව්වල ජනතාවට ද ධර්ම දායාදය පිරිනැමීමේ ආරම්භක පියවර ද එයම විය.

පෙර ඇසළ පොහොය දිනෙක රාත්‍රි කාලයේ සිදුහත් කුමරු කිඹුල්වත්පුර නුවරින් නික්මුණු තැන් පටන් මහත් සේ කම්පාවට පත් සුද්ධෝදන මහරජු තම පුතු දැකබලා ගැනීමේ බලවත් ආශාවෙන් පසු විය. බුද්ධත්වයෙන් පසුව බිම්බිසාර රජුගේ පාලනය යටතේ පැවැති මගධ රාජ්‍යයේ වේළුවනාරාමය නම් වූ සුන්දර ආරාමයෙහි බුදුරදුන් වැඩවෙසෙන බව දත් පියරජු උන්වහන්සේට කිඹුල්වත් පුරයට වැඩමවන ලෙස ආරාධනා කරන මෙන් දන්වා ඇමැතියකු ප්‍රමුඛ දූත කණ්ඩායමක් රජගහනුවර වේළුවනාරාමයට පිටත්කොට යැවී ය. එම පිරිස එහි ගොස් බුදුරදුන් වෙතින් බණ අසා පැහැදී පැවිදි වූ අතර රජුගේ ඉල්ලීම ඉටු නොකළහ.

මෙසේ ඇමැතිවරු නවදෙනෙක් සහිතව නව වාරයක් ම දූත පිරිස් පිටත්කොට යැවූ නමුත් ඉන් එක ද පුද්ගලයෙක් හෝ නැවත නොපැමිණිය හ. පෙර සේම සිදුවූයේ ඔවුන් බුද්ධශ්‍රාවකයන් බවට පත්වීම පමණෙකි. දස වැනි වාරයේ දී සිදුහත් කුමරු උපන් දිනයේ ම උපත ලැබූ කාළුදායි ඇමැතිවරයා දහසක දූත කණ්ඩායමක් ද සමග රජගහනුවර වේළුවනාරාමයට පිටත්කර හැරීය. බුදුරදුන්ගෙන් ධර්මය අසා පැවිදිවීම සඳහා ද රජුගෙන් අවසරය ලබාගත් කාළුදායි සහපිරිවරින් යුක්තව කිඹුල්වත්පුර නුවර සිට රජගහනුවර වේළුවනාරාමයට ගියේ ඉමහත් සොම්නසිනි. එහිදී බුදුරදුන් හමු වූ කාළුදායි බණ අසා පැවිදිව රහත් ඵලය ද ලබා ගත්තේ ය.

ඉක්බිතිව කාළුදායි තෙරුන්ගේ පැවිද්දෙන් දින හත අටක් ගතවිය. ඒ සමගම කාලගුණය ද බෙහෙවින් ම යහපත් වූ වසන්ත සමය උදාවිය. බුදුරදුන්ව සිය ජන්මභූමියට වැඩමකරවීම සඳහා මේ සුදුසුම කාලය බව කාළුදායි තෙරණුවෝ වටහා ගත්හ. එබැවින් බුදුරදුන් වෙත එළඹි කාළුදායි තෙරණුවෝ සිත්ඇදගන්නා සෞන්දර්ය වර්ණනාවකින් යුක්තව රජගහනුවර සිට කිඹුල්වතට යන සැට යොදුන් ගමන් මග වර්ණනා කළහ. මෙම මග වැණුමෙන් යුත් ආරාධනය පිළිගත් බුදුරදුන් විසිදහසකට අධික භික්ෂු පිරිස පිරිවරා ස්වකීය ජන්ම භූමිය බලා ගමනාරම්භ කළහ. සියොතුන්ගේ විවිධ නාදයන්ගෙන් සමන්විත මං මාවත් මැදින් දිය කඩිති, බඩවැටි අතරින් වැඩම කළ බුදුරදුන්ගේ මෙම අසිරිමත් ගමන මුළු ලොවම සනසාලන පරිසර පාද යාත්‍රාවක් විය. මෙසේ දෙමසක් පා ගමනින් වැඩම කළ බුදුරදුන් ප්‍රමුඛ සඟගණ වෙසක් පොහෝදා කිඹුල්වත් පුරයට වැඩම කළහ.

අදවන් මැදින් පොහෝ දිනෙක ඇරඹුණු බුදුරදුන්ගේ කිඹුල්වත්පුර චාරිකාව ශාසනික වශයෙන් සුවිශේෂී සිද්ධි මාලාවක මූලාරම්භය විය. එබැවින් මැදින් පොහෝ දිනයේ වැදගත්කම මෙනෙහිකොට දාන, සීල, භාවනා යන ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවන්හි යෙදෙමින් මෙම දිනය අනුස්මරණය කිරීමට සැවොම අදිටන් කරගත යුතුය.